# 4 ශ්‍රේණිය සිංහල ගුරු අත් පොතට වැඩ පොත - අංක 10

## L7, S7, R7, W7

## නිපුණතා ආවරණය - 2021



- ජන ක්‍රීඩාවක යෙදෙමින් ප්‍රායෝගික අත්දැකීම් ලබයි.
- සාහිත්‍ය සමිතියක දී ඉදිරිපත් වීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
- සාහිත්‍ය සමිතියක් මෙහෙයවීමේ පරිචය ලබයි.
- මාතෘකාවකට අදාළ ව කරුණු ගොනු කරයි.

**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

For Online Class details WhatsApp 071-9020298

# <u>5 ශ්‍රේණිය මව්බස (සිංහල)</u>
# <u>$L_7$ $S_7$ $R_7$ $W_7$ ඉගෙනුම් පල</u>

- ජන ක්‍රීඩාවක යෙදෙමින් ප්‍රායෝගික අත්දැකීම් ලබයි.
- සාහිත්‍ය සමිතියක දී ඉදිරිපත් වීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
- සාහිත්‍ය සමිතියක් මෙහෙයවීමේ පරිචය ලබයි.
- මාතෘකාවකට අදාළ ව කරුණු ගොනු කරයි.

## <u>ජන ක්‍රීඩා</u>

- කියවීම් පොතේ ඇතුළත් රබන් වයමු දොං තා පාඩමේ පහත රබන් පද මහ රබානක්/බංකු රබානක් වාදනය කරමින් ගායනා කරන්න. පැවරුමේ රබන් පද සම්පූර්ණ කරන්න.

1. රන් රඹුටන් ගස් දෙක යට
ගිනි කුකුළන් පස් දෙන යි
උන්ට කන්ට බත් දෙන විට
උනුත් එක්ක ලස්සන යි

2. අපේ ගෙදර තුන් දෙන යි
උඩහ ගෙදර තුන් දෙන යි
පහළ ගෙදර තුන් දෙන යි
තුන් පොළේ ම නව දෙන යි

3. ගඟෙන් එගොඩ ගඟ අසබඩ
ගසක පැණි දොඩම්
තක දොං ගසක පැණි දොඩම්
තක දොං ගසක පැණි දොඩම්

4. වමත හුරුයි - දෝංතා
දකුණ හුරුයි - දෝංතා
වමත හුරුයි - දකුණ හුරුයි
දෙක ම හුරුයි - දෝංතා

5. තාක්ක දොං දොං තාක්ක දොං දොං
තෝක්ක මල් පිපිලා
ඔන්න බලන් සකි මෙන්න බලන් සකි
පාරට අතු නැමිලා

6. රෑන ගිරවු නටනෙයි ගුදං ගුද
පේර දොඩම් වැටෙනෙයි විටිං විට
පේර දොඩම් වැටෙනෙයි

| |
|---|
| ලබා දී ඇති රබන් පදවලට අමතර ව තවත් රබන් පද එකතු කර පොත් සෑදීමට ලබාදීම නොකළ යුතු ය. |

1. රන් රඹුටන් ගස් දෙක යට
. . . . . . . . . . . . . . . . . . . . . . . .
උන්ට කන්ට බත් දෙන විට
. . . . . . . . . . . . . . . . . . . . . . . .

2. ගඟෙන් එගොඩ ගඟ අසබඩ
. . . . . . . . . . . . . . . . . . . . . . . .
තක දොං ගසක පැණි දොඩම්
. . . . . . . . . . . . . . . . . . . . . . . .

3. රෑන ගිරවු නටනෙයි ගුදං ගුද
. . . . . . . . . . . . . . . . . . . . . . . .
. . . . . . . . . . . . . . . . . . . . . . . .

# සාහිත්‍ය සමිති

- සමිතිය පැවැත්වෙන අතරතුර සිටිය යුතු ආකාරය.

  1. නිශ්ශබ්ද ව සිටීම
  2. අවධානයෙන් සිටීම
  3. සංයමයෙන් සිටීම
  4. සුදුසු අවස්ථාවල අත්පොළසන් දීම
  5. නිමාව තෙක් රැඳී සිටීම

- සාහිත්‍ය සමිතිය වාර්තාව කියවා පිළිතුරු ලියන්න.

ගුරුවරයා : ආයුබෝවන් දුවේ, පුතේ,
ඔබගේ සාහිත්‍ය සමිතියේ කටයුතු ආරම්භ කිරීමට දැන් සියලු දේ සූදානම්. සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලෙස මම සභාපතිතුමාට හා ලේකම්තුමියට ආරාධනා කරනවා.

සභාපති : (පිළිගැනීමේ කතාව කරයි. පසු ව ඊළඟ විශේෂාංගයට ඇරයුම් කරයි.) අපේ සමිතියේ පළමු වන විශේෂාංගය කණ්ඩායම් ගීතයක්. ඒ සඳහා සභාව ඉදිරියට පැමිණෙන ලෙස කණ්ඩායමේ සියලු දෙනාට ම ආරාධනා කර සිටිනවා.

කණ්ඩායමේ එක් අයෙක් : සභාවෙන් අවසර යි. අපි මෙතැනට පැමිණියේ "හඳයා" චිත්‍රපටයේ ගීතයක් ගැයීමට යි. (ගීතය ගායනා කරයි.)

කණ්ඩායමේ වෙනත් අයෙක් : අපේ ගීතය රසවිඳි ඔබ සැමට ස්තුතියි.

සභාපති : බොහොම හොඳ ගීතයක්. හරි ම ලස්සනට ගායනා කළා. ඔබ සැමට ස්තුති යි. අපේ ඊළඟ විශේෂාංගය මාතෘකාවකට අනුව කතාවක් කිරීම යි. මගේ මේ ආරාධනය . . . සොහොයුරාට/සොහොයුරියට යි.

සොහොයුරා/සොහොයුරිය : මම අද කතා කරන්න යන්නේ . . . ගැන. ඒ සඳහා මම ඔබ සැමගෙන් අවසර පතනවා. (කතාව ඉදිරිපත් කරයි.)

සභාපති : කාලයට ගැළපෙන මාතෘකාවක් තෝරා ගැනීම ගැන මම ඔබට ස්තුති කරනවා. ඊළඟට අපේ යාළුවෝ සූදානම් නාට්‍යයක් රඟදැක්වීමට. ඔබට යි මේ ආරාධනාව.

නාට්‍ය කණ්ඩායමේ එක් අයෙක් : සභාපතිතුමාට බොහොම ස්තුති යි, අපට මේ අවස්ථාව ලබා දුන්නාට. අපි අද ඉදිරිපත් කරන්නේ . . . නාට්‍යය. ඔබ සැමගෙන් අපට අවසරයි. (නාට්‍ය ඉදිරිපත් කරයි.)

සභාපති : මම ඒ කණ්ඩායමට සුබ පතන ගමන් ම ස්තුති කරනවා. බොහොම ලස්සන නාට්‍යයක්. අපේ අවසාන විශේෂාංගය තේරවිලි. එය ඉදිරිපත් කරන සොහොයුරු සොහොයුරියන්ට යි මේ ආරාධනාව. (තේරවිලි විශේෂාංගය ඉදිරිපත් කරයි.)

කණ්ඩායමේ කෙනෙක් : අපේ සූදානම තේරවිලි ඉදිරිපත් කිරීමට යි. ඒ සඳහා ඔබ සැමගෙන් අප අවසර පතනවා. (තේරවිලි ඉදිරිපත් කරයි.)

සභාපති : අපි බොහොම කැමතියි තේරවිලි තෝරන්න. මේ විශේෂාංගය ඉදිරිපත් කළ ඔබ සැමට ස්තුති යි. මම දැන් සූදානම් වන්නේ සමිතියේ වැඩ කටයුතු අවසන් කරන්න. ලේකම්තුමාට/තුමියට ස්තුති කතාව කිරීමට යි මේ ඇරයුම.

ලේකම්තුමා/තුමිය : (ලේකම්තුමා/තුමිය ස්තුති කතාව කරයි.)

1. පිළිගැනීමේ කතාව කළේ කවරෙක් ද ?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. සමූහ ගීතය කුමන චිත්‍රපටයේ ගීතයක් ද ?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3. මාතෘකාවට අනුව කතාව කළේ කවරෙක් ද ?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

4. ඉදිරිපත් කළ නාට්‍යයේ නම කුමක් ද ?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

5. ස්තුති කතාව කළේ කවරෙක් ද ?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

6. සමිතියේ ඉදිරිපත් කළ වැඩසටහන් පෙළගැස්ම අනුව අංක යොදන්න.

| | |
|---|---|
| | පිළිගැනීමේ කතාව |
| | ස්තුති කතාව |
| | සමූහ ගීතය |
| | නාට්‍ය |
| | තේරවිලි |
| | මාතෘකාවකට කතා කිරීම |

## <u>මාතෘකාවකට අදාළව වාක්‍ය ලිවීම</u>

- මාතෘකාවකට අදාළ ව වාක්‍ය ලිවීමේ දී අදාළ කරුණු රුස් කරගන්නා ආකාරය.
  - ✓ මාතෘකාවට අදාළ පොත්පත් කියවීමෙන්
  - ✓ පුවත්පත්වල මාතෘකාවට අදාළ කොටස් කියවීමෙන්
  - ✓ අන්තර්ජාලයෙන් මාතෘකාවට අදාළ තොරතුරු සොයා ගැනීමෙන්
  - ✓ මාතෘකාවට අදාළ තොරතුරු වැඩිහිටියන්ගෙන් අසා දැන ගැනීමෙන්

- ලියන මාතෘකාවට අදාළ ව කරුණු ගොනු විය යුතු ආකාරය.

  (මාතෘකාව මගේ රට යැයි සිතමු.)

  - ✓ පළමු වන වාක්‍යයෙන් රට පිළිබඳ හඳුන්වා දීම ද,
  - ✓ දෙවන, තුන් වන හා හතර වන වාක්‍යවලින්,
    - රටේ තිබෙන සම්පත්
    - රටේ ජීවත් වන ජාතීන්
    - රටේ සුන්දරත්වය ගැන පැහැදිලි කිරීම ද,
  - ✓ පස් වන වාක්‍යයෙන් රටේ දියුණුව ප්‍රාර්ථනා කිරීම ද කළ හැකි ය.

- වාක්‍ය ලිවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු.
  - ✓ මාතෘකාවට අදාළ විය යුතු බව
  - ✓ වාක්‍ය විවිධත්වයෙන් යුතු බව
  - ✓ එක ම අදහස ඇති වාක්‍ය දෙවරක් ලිවීම නොකළ යුතු බව
  - ✓ උක්ත - ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි ව ලිවිය යුතු බව
  - ✓ අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු බව
  - ✓ ලිඛිත භාෂාවෙන් ලිවිය යුතු බව
  - ✓ පැහැදිලි අත්අකුරෙන් ලිවිය යුතු බව
  - ✓ නිවැරදි ව වචන වෙන් කර ලිවිය යුතු බව
  - ✓ වචනයක අකුරු ගැවෙන සේ ලිවීම නොකළ යුතු බව
  - ✓ විරාම ලකුණු නිවැරදි ව යෙදිය යුතු බව

- පහත සඳහන් උදාහරණය බලා දී ඇති මාතෘකාවලට අදාළ වාක්‍ය පහ බැගින් ලියන්න.

**මගේ රට**

1. මගේ රට ශ්‍රී ලංකාව යි.
2. ඉන්දිය සාගරයේ මුතු ඇටය ලෙස ද මගේ රට හඳුන්වයි.
3. විවිධ ජාතීන්ට අයත් මිනිස්සු මෙහි සමඟියෙන් ජීවත් වෙති.
4. ලස්සන ගංගා, දියඇලි, මල්වතු ආදියෙන් මගේ රට අලංකාර වේ.
5. මම සැම විටම මගේ රටේ දියුණුව ප්‍රාර්ථනා කරමි.

1. ජලය අපට සම්පතකි.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. මා කැමති ම ක්‍රීඩාව.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3. පරිසරය ආරක්ෂා කරමු.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

4. මුහුදු වෙරළ.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

5. වැස්ස.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

## 1) <u>මම වෛද්‍යවරයෙක් වී රටට සේවය කරමි</u>

- ............ඉතා හොඳින් ඉගෙන ගෙන අනාගතයේ දී වෛද්‍යවරයෙක්..............
- ............ඉතා දුෂ්කර ප්‍රදේශවලට ගොස් රටට සේවය ...........................
- ............වෙතට ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණෙන .....................ට මම ඉතා කරුණාවෙන් සළකමි.
- මාගේ රෝහලේ සේවකයන්ට ද ................ ඉතා හොඳින් .....................
- මාගේ දේශයේ ජනතාව ............................ ජනතාවක් කිරීමට මම ඇපකැප වී සේවය .....................

## 2) <u>මා දුටු සුන්දර ම ස්ථානය</u>

- ................ දුටු සුන්දර ම ස්ථානය හෝර්ටන් තැන්න .......................
- එය ........................පළාතේ පිහිටා ඇති ඉතා.............................. ස්ථානයකි.
- හෝර්ටන් තැන්නේ .......................... දර්ශනීය දිය ඇලි දෙකක් දක්නට .....................
- එහි ශරිරයේ ....................... පිපෙන තරමට ..................... දැනෙයි.
- ............................ නම් ඉතා දළ බෑවුමක් පිහිටා ඇති හෝර්ටන් තැන්න නැරඹීමට හැකි වීම ජීවිතයේ මා ලද ..................................

## 3) මගේ පුස්තකාලය

- .........................මම මගේ ගෙදර පුස්තකාලයක් සාදා .........................
- එහි කවි, රචනා, කතා, ගීත.....................පොත් රාශියක් .......................
- පුස්තකාලයට අවශ්‍ය පොත් මට ....................... නිතරම ගෙනවිත් ...............
- මම එහි පොත් ඉතා .............................. සකස් කර ..................................
- මගේ පුස්තකාලය ..................... දක්ෂ ළමයෙකු බවට.................................

## 4) වනාන්තරයේ අසිරිය

- වනාන්තරය අපේ .................. ත් ......................... ත් සිසිලසක් ලබා දෙයි.
- සුළඟ සමඟ මුසු ව එන මල් සුවඳින් දසත සුවඳවත් ...........................
- වන මැදින් ගලා යන දිය පාරවල ...................හඬ වනය ....................... කරයි.
- එහා මෙහා පියාසලන අලංකාර.............................. වනයට සුන්දරත්වයක් ..................................
- අපා, දෙපා, සිව්පාවෝ මෙන්ම තුරු ලතාවලින් විසිතුරු වන වනයේ අසිරිමත් බව අපි ................................

## 5) සරුසාර මගේ රට

- මහවැලි, කැලණි, කළු, වලවේ යන සිව් මහා ............................. මගේ රට සරුසාර ............................
- ඉවත දමන දඹුව වුවද දලු ලා යළි ....................... තරමට මෙහි පොළොව .............................
- නිල් පලසක් එළුවා සේ .....................වෙල් යාය .............................
- සදාහරිත ........................සැම කල්හිම ............................බැබළෙයි.
- කඳු මුදුන් කොළ පැහැයෙන් වසා ගත්............................ රටට සම්පත් ........................

## 6) රටට පිපෙන මල් අපි වෙමු

- විකසිත වී සුවඳ හමන මල් මෙන් නිදහසේ සතුටින් සැරිසරන පුංචි ළමයි ............. .................
- විල මැද පිපුණු මහනෙල් මල් මෙන් ................. රටට සුන්දරත්වයක් ගෙන.........
- අපි කඩිසර බවින් ක්‍රියාශීලි ව ලක් මව සරසන පුංචි මල් කැකුළු .........................
- හොඳින් ඉගෙන ගෙන යහපත් පුරවැසියන් වී ..................... ලක් මවට සේවය ..................................
- ලංකා මැණිගේ ගෙලෙහි පැළඳ වූ මාලයක් මෙන් ................. රට .......................

## 7) කුරුළු ලැල්ලට එන මගේ කුරුළු මිතුරෝ

- සැම දින ම උදැසන කුරුල්ලන්ගේ හඬින් ................ අවදි .......................
- ..................... පිබිදුණු විගසම කුරුළු ලැල්ල වෙත ............................
- .....................කෑම දමන තෙක් කුරුල්ලෝ නොනවත්වා ...........................
- .................. දමන ආහාර ඔවුන් බුදින අයුරු සතුටින්.................... බලා සිටිමි.
- කුසගිනි නිවා ගෙන සතුටින් පිටව යන .................................. නිසා

  ..................... අපමණ සතුටක් ....................

## පුනරීක්ෂණ

**(01) පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

කලණ මිතුරු ළමා සමාජයේ සෑම මාසයකම අවසාන සෙනසුරාදා සමිති වාරය පැවැත්වේ. අවුරුදු උත්සවය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා මාර්තු මස රැස්වීම පැවැත්විණි. ලේකම්තුමා විසින් පසුගිය සමිති වාරයේ වාර්තාව කියවන ලදී. එය සත්‍ය වාර්තාවක් බවට කාව්‍යා හා සංඛ යෝජනා ස්ථිර කළහ.

(1) ඡේදයෙන් කියවෙන ළමා සමාජයේ නම කුමක්ද?

.........................................................................

(2) සමිති වාරය මසකට වරක් පැවැත්වෙන්නේ කවදාද?

.........................................................................

(3) මාර්තු මස පැවැති සමිති වාරයේදී සාකච්ඡා කළේ කුමක් ගැනද?

.........................................................................

(4) පසුගිය සමිති වාරයේ වාර්තාව ඉදිරිපත් කළේ කවුද?

.........................................................................

(5) පහත පදවලට විරුද්ධ පද ලියන්න.

(i) සත්‍ය - .................. (ii) අවසාන - ................

(6) පහත පදවලට සමාන පද ලියන්න.

(i) අවුරුදු - .................. (ii) සත්‍ය - ................

(7) මහප්‍රාණ අකුරක් සහිත වචනයක් තෝරා ලියන්න.

.........................................................................

(8) 'අවුරුදු' මේ වචනය සඳහා යෙදී ඇති පිල්ලම කුමක්ද?

.........................................................................

**(02) නිවැරදි අකුර යොදා හිස්තැන් පුරවන්න.**

1. වාර් ...... ක (ෂි/ශි)
2. ප්‍රදර් ...... නය (ශ/ස)
3. ප්‍ර ...... න (ශ්/ස්)
4. රි ...... න (ශා/සා)
5. ස ...... දර්ශනය (ං/න්)

**(03) ගැළපෙන පරිදි 'ඇ/ඇය/ඔහු/ඌ' යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

1. තාත්තා මිදුලේ සිටියි.

   ................ එළවළු පාත්තියට පොහොර දමයි.
2. අම්මා කුස්සියේ සිටියි.

   ................ රස කෑමක් සාදයි.
3. මල්ලි සෙල්ලම් කරයි.

   ................ සෙල්ලම් කාර් බස්වලට බොහෝ කැමතියි.
4. සිංහයා ගස යට නිදයි.

   ................ දඩයම ප්‍රිය කරයි.
5. වෛද්‍යවරිය බොහෝ කාරුණිකයි.

   ................ රෝගියාට කරුණාවෙන් කතා කරයි.

**(04) පහත සඳහන් පිරුළු සම්පූර්ණ කරන්න.**

1. ඉඟුරු දීලා ..................................................
2. ආඬි හත්දෙනාගේ ..................................................
3. කළුවා ..................................................
4. කටුස්සාගේ කරේ ..................................................
5. කැකිල්ලේ රජ්ජුරුවන්ගේ ..................................................